සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

11 ශ්‍රේණිය — වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) — 40 S I

නම: ..........................................

**නර්තනය I හා II**

කාලය පැය 03යි

වැදගත් :

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
**අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති 1,2,3,4 පිළිතුරු වලින් වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.**

1) "උඩහගෙදර රංකිරි තංගිලත් ඇවිල්ලා" ...... නැටුමට අයත් ගායනයකි.
i. කුළු ii. ගොයම් iii. කළගෙඩි iv. මෝල්ගස්

2) පොකුරුබෙරය හා එකැස්බෙරය ............... නමින් ද හඳුන්වනු ලැබේ.
i. උඩැක්කිය හා දවුල ii. ගැටබෙරය හා රබාන
iii. තම්මැට්ටම හා රබාන iv. තම්මැට්ටම හා දවුල

3) නළුවා රංගනය කිරීමේදී හාස්‍ය, ප්‍රහර්ෂ,දුක්ඛ, දෝමනස්ස ආදි කොට ඇති මිනිස් ස්වභාව නිරූපණය කිරීම ........................ ලෙස හැඳින්වේ.
i වාචික අභිනය ii. ආංගික අභිනය
iii. ආහාර්ය අභිනය iv. සාත්වික අභිනය

4) මිරැන්ඩා හේමලතා මහත්මිය විසින් ............ දී සොන්ටා ජාත්‍යන්තර සම්මානය ලබා ගන්නා ලදී.
I 1980 ii 1985 iii 1986 iv 1988

5) "නළලෙහි සලකුණු තබා දේවදාසීන් හත් දෙනෙකු පිදූ බව" ............... සෙල්ලිපියෙහි සඳහන් වේ.
i. පාලමොට්ටායි ii. සැස්සේරුව
iii කොරවක්ගල iv. බ්‍රාහ්මී

6) එක් සැරයටියක් සුරතින් දරා ................. යන මෙම ගායනය ............... පෙළපාලියේය.
i. ඌරා යක්කම ii. දෙවොල් ගොඩ බැසීම
iii අඹ විදමන iv. නයා යක්කම

7) පහතරට සින්දු වන්නම් ..................... යුගයන්හි රචනා වූ බව නිගමනය කළ හැකිය.
i. මහනුවර හා කෝට්ටේ ii. ගම්පොළ හා කෝට්ටේ
iii. දඹදෙණි හා කෝට්ටේ iv. දඹදෙණි හා ගම්පොළ

8) මුද්‍රා නාට්‍ය ශිල්පියෙකු වූ ප්‍රේමකුමාර එපිටවෙල මහතා විසින් ................. මුද්‍රානාට්‍ය නිර්මාණය කර ඇත.
i. පටාචාරා, කුණ්ඩලකේශී ii. සත්පත්තිනි, ග්‍රහ අපලය
iii. හිරෝෂිමා, කුඹුරුපනත iv. පරෙවියා , දියවන්නාව

09 උඩුවේරිය බණ්ඩාර, කන්දේ බණ්ඩාර දෙවියන් පුද ලබන්නේ ............... ශාන්ති කර්මයේය.
i. කොහොඹා කංකාරිය ii. දෙවොල් මඩුව
iii. පහන් මඩුව iv. කිරි මඩුව

10 " පුරවර මැද බැඳි රන් ඔන්චිල්ලා" මෙහි දෙවැනි කවිපදය ............ වේ.
i. වැරසර පිරිමිනි තව පැදපල්ලා iii. සුරපුර දෙවියන් රැකුමෙ සියල්ලා
ii. දුරයන තරමට පුදුම නොවෙල්ලා iv. අපිත් පදිමු දැන් රන් ඔන්චිල්ලා

11) උඩරට නර්තන සම්ප්‍රදායේ ගොඩසරඹ වලට සමාන පහත රට හා සබරගමු සරඹ විශේෂ හඳුන්වන්නේ, පිළිවෙලින්,
i. මණ්ඩිපද හා දොඹින පද ලෙසය ii. මාත්‍රා පහ සහ දොඹින පද ලෙසය
iii. ඉලංගම් සරඹ හා දොඹින පද ලෙසය iv. දොඹින පද හා ඉලංගම් සරඹ ලෙසය

12) අශෝක අධිරාජයා විසින් ලක්දිවට දක්ෂිණ බෝධි ශාඛාව වැඩම වන අවස්ථාවේදී පංචතූර්ය නාදය පැවැත්විය යුතු බවට සඳහන් වූ ග්‍රන්ථය වන්නේ,
i. බෝධි වංශය ii. චූලවංශය iii. දීප වංශය iv. මහා වංශය

13) ශෝක භාවය තුළින් නිරූපණය කරන රසය වන්නේ,

i. ශාන්ත ii. කරුණා iii. හාස්‍ය iv. අද්භූත

14) භරත නාට්‍යම්හි සංගීත ශිල්පීන් හඳුන්වන්නේ,

i. නටුවනාර් ලෙසය ii. පත්තුකාරන් ලෙසය

iii. මුත්තු කාරන් ලෙසය iv. පොන්නාතී ලෙසය

15) අතීතයේ රාජ්‍ය පාලන කටයුතු වලදී වරදකරුවකු දඬුවම පමුණුවන ස්ථානය කරා ගෙන යාමේදී එම සන්නිවේදනය සිදු කරන්නේ,

i. අණබෙර වැයීමෙනි. ii. මළබෙර වැයීමෙනි

iii. වදබෙර වැයීමෙනි iv. රණබෙර වැයීමෙනි

16) කෝලම් නාටක ඉදිරිපත් කිරීමේදී සෑම විටම ගායනයට මුල පුරන්නේ,

i. හොරණෑ වාදකයා විසිනි iii. කාරිය කරවන රාල විසිනි

ii. සබේ විදානේ විසිනි iv. අත්වැල් ගායක කණ්ඩායම විසිනි

17) "කැලෑ මල්" ගීත නාට්‍යය නිර්මාණය කරන ලද්දේ,

i. එදිරිවීර සරත්චන්ද්‍ර මහතා විසිනි ii. ප්‍රේමසිරි කේමදාස මහතා විසිනි

iii. මකුලොලුව මහතා විසිනි iv. දයානන්ද ගුණවර්ධන මහතා විසිනි

18) තිස්තුන්වන සින්දු වන්නම ලෙස හැඳින්වෙන්නේ

i. මරගන වන්නම ය. ii. සමන් දෙවිරද වන්නමය

iii. මන්තිරි වන්නම ය iv. සිරිකත වන්නමය


A

B

C

19. පංච තූර්ය වාද්‍ය භාණ්ඩ වර්ගීකරණයට අනුව ඉහත A, B, C රූප මගින් දැක්වෙන වාද්‍ය භාණ්ඩ පිළිවෙළින්,

i. ආතත, විතතාතත හා ඝණ වේ. iii. විතත, විතතාතත හා ආතත වේ.

ii. විතතාතත, ආතත හා සුසිර වේ. iv. ආතත, විතත හා විතතාතත වේ.

20. වත්මනෙහි පවතින ශුද්ධ මාත්‍රා නැටුමේ පද කොටස් නිර්මාණය කරන ලද්දේ,

i. ඒ. ඉඹුල්ගොඩ මහතා විසිනි iii. කේ.එස්. ප්‍රනාන්දු මහතා විසිනි

ii. විල්සන් ඔලබොඩුව මහතා විසිනි iv. සිරිබෝහාමි මහතා විසිනි.

**ප්‍රශ්න අංක 21 - 24 දක්වා පිළිතුරු පහත වගුව ඇසුරෙන් ලියන්න.**

| | A | B | C | D |
|---|---|---|---|---|
| 01 | තට් අඩව් | කේලිකුත්තු | තිල්ලානා | ආමද් |
| 02 | පදම් | රාමාට්ටම් | සලාම් | ක්‍රිෂ්ණාට්ටම් |
| 03 | ශ්ලෝකම් | රාස්ලීලා | පුංග්චෝලම් | ඔට්ටම් තුල්ලල් |
| 04 | තෝඩායම් | සංකීර්තන් | සධීර් අටම් | නාට්‍ය අඩව් |

21) කතකලි ප්‍රභවයට හේතු වූ ගැමි නාටක දක්නට ලැබෙන්නේ,

i. 4 පේළියේ A හා C ය. ii. 3 පේළියේ B හා D ය.

iii. 2 පේළියේ B හා D ය. iv. 2 පේළියේ C හා 3 පේළියේ D ය.

22) භරත නාට්‍යම්හි පාද හුරු කර ගැනීම හා දෑත හුරු කර ගැනීම සඳහා භාවිත අඩව් විශේෂ දක්නට ඇත්තේ,

i. 3 පේළියේ A හා 1 පේළියේ D ය. ii. 1 පේළියේ A හා C ය.

iii. 4 පේළියේ B හා D ය. iv. 1 පේළියේ A හා 4 පේළියේ D ය.

23) කතක් නර්තන සම්ප්‍රදායට අයත් නර්තන අංග දක්නට ලැබෙන්නේ,

i. 2 පේළියේ A හා 3 පේළියේ C ය. iii. 1 පේළියේ D හා 2 පේළියේ C ය.

ii. 3 පේළියේ A හා B ය. iv. 4 පේළියේ A හා B ය.

24) මනිපුරි නර්තන සම්ප්‍රදායේ කන් විදීම, බත් කැවීම වැනි සාමූහික උත්සව අවස්ථා වලදී රඟ දක්වන නර්තන අංග දක්නට ලැබෙන්නේ,

i. 4 පේළියේ B ය. ii. 3 පේළියේ C ය.

iii. 2 පේළියේ A ය. iv. 1 පේළියේ D ය.

25) "රට යකුම හෙවත් රිද්දි යාගය" හා" ශාන්ති කර්ම හා සිංහල සමාජය "යන ග්‍රන්ථ රචනා කළ ගත් කතුවරයාවන්නේ,

i. මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ ය iii. මහාචාර්ය තිස්ස කාරියවසම් ය

ii. මහාචාර්ය මුදියන්සේ දිසානායක ය iv. මහාචාර්ය ශ්‍රියානි රාජපක්ෂය

26). දේශීය ප්‍රධාන ශාන්ති කර්ම තුනටම පොදු ගායනා දක්නට ලැබෙන්නේ,

i. මඩුපුරේ කවි, කඩතුරා කවි, කෝල්මුර කවි ය
ii. සිරසපාද කවි, කඩතුරා කවි, කෝල්මුර කවි ය
iii. කඩතුරා කවි, මල් යහන් කවි, අටමගල කවි ය
iv. කෝල්මුර කවි, මඩුපුරේ කවි, මල්යහන් කවි ය

27). කොහොඹ කංකාරිය, පහන් මඩුව හා දෙවොල් මඩුව ශාන්ති කර්ම වලට අයත් ගායනා සහිත නර්තන අංග ඇතුළත් නිවැරදි වරණය වන්නේ,

i. යක්කැනුම, තොරන්යාගය හා තෙල්මෙ නැටීම.
ii. කුවේණි අස්න, තෙල්මෙ නැටීම හා යහන් දැක්ම
iii. මඩුපුරය, මල් මඩුපුරය හා තොරන් යාගය
iv. යක්තුන් පදය, මුගුරු පද හා හත්පද පෙළපාලිය

28) උඩරට හා සබරගමු නර්තන සම්ප්‍රදායන්ට අයත් නාට්‍යමය පෙළපාලි දෙකක් වන්නේ,

i. ඌරා යක්කම හා දර්පන යක්කම
ii. අසුර යක්කම හා නයා යක්කම
iii. රාමා යක්කම හා පොත්කඩේ යක්කම
iv. වැදි යක්කම හා පොත්කඩේ යක්කම

29) පින්නල් කෝලාට්ටම්, සුලකු හා කොළුන්දු පරිත්තල් යන ද්‍රවිඩ ගැමි නැටුම් හා සමාන සිංහල ගැමි නැටුම් වන්නේ,

i. ලී මල්ලිය, කුලු හා තේ දළු ය
ii. ලී කෙලි, කළගෙඩි හා ගොයම් නැටුම ය
iii. කළගෙඩි, ලී කෙළි හා කුලුය
iv. ගොයම්, ලී කෙළි හා තේ දළු ය

30). කුඹී කතාව මුද්‍රා නාට්‍යයේ කලා කටයුතු හා රංග වස්ත්‍ර නිර්මාණය කරන ලද්දේ,

i. ටානියා බැරකෝමා විසිනි
ii. අංජලිකා චිත්‍රසේන විසිනි
iii. මහේෂ් උමගලිය විසිනි
iv. රොබට් ජූලින්හි විසිනි

31). කුදාංත ගත දොං වට්ටමට අදාළ තාල රූපය වන්නේ,

i. මාත්‍රා 2 + 3 ය.
ii. මාත්‍රා 2 + 2 + 4 ය.
iii. මාත්‍රා 2 + 4 ය.
iv. මාත්‍රා 3 + 4 යි

32). ගැටබෙරයේ දිග හා බෙර ඇසෙහි විශ්කම්භය වන්නේ,

i. තුන්වියත් තුනගුලක් හා විග්ගුස්ස කි.
ii. එක් වියත් තුනගුලක් හා අඟල් 7 කි.
iii. තුන්වියත් දැගුලක් හා විග්ගුස්සකි.
iv. එක් වියත් තුනගුලක් හා අඟල් 8 කි

33). සිංහරාජ වන්නමට හා වෛරෝඩි වන්නමට අදාළ බෙරපද වන්නේ,

i. දොං පිංත ගත දොංත හා පිංගතගොගො ය
ii. පිංග තගොගො හා දොදොංත තකුදොංය
iii. දොංදොංත තකුදොං හා පිංගත ගොගොය
iv. දොම්කිත කිත දොං හා දොං දොං පිං පිං ගපිගතය

34). උඩරට නර්තන සම්ප්‍රදායට පමණක් ආවේණික ශාන්ති කර්ම ඇතුළත් වරණය වන්නේ,

I. කොහොඹා කංකාරිය, කිරි මඩුව හා වලියක් මංගල්‍යය
ii. කොහොඹා කංකාරිය, කඩවර කංකාරිය හා ගම්මඩුව ය.
iii. කොහොඹා කංකාරිය, කඩවර කංකාරිය හා වලියක් මංගල්‍යය
iv. වලියක් මංගල්‍යය, කඩවර කංකාරිය හා පහන් මඩුව ය.

35). " වන පැත්ත බිය පත්ව සයනම්" මෙම ගායනය අන්තර්ගත වන්නම වන්නේ,

i. සැවුලා ii. මුසලඩි iii. සිංහරාජ iv. වෛරෝඩිය

36). " ගත්ත තෙහිගු තකට තකු ද" යන අඩව්ව අයත් වන්නේ,

i. හනුමා ය. ii. තුරගා ය. iii. වෛරෝඩි ය. iv. සිංහරාජ ය.

37) හත්වෙනි පා සරඹය හා නමවෙනි ගොඩ සරඹයේ සරඹ නාම වන්නේ,

i. අංගහාර සරඹය හා ඇල සරඹය
ii. අර්ධචක්‍ර සරඹය හා දෑත පැගීමේ සරඹය
iii. ඇල හරඹය හා නුහුරු අඩිය ය.
iv. නුහුරු අඩිය හා දෑත පැගීමේ සරඹය ය.

38) "අත්‍යාබෙර වාදනය" දක්නට ලැබෙන්නේ

i. දෙවොල් මඩුව ශාන්ති කර්මයේ ය
ii. කොහොඹා කංකාරිය ශාන්ති කර්මයේය
iii. කිරි මඩුව ශාන්ති කර්මයේ ය
iv. පහන් මඩුව ශාන්ති කර්මයේ ය

39). " තා පිං තත් තත් පිං තත් පිං තත් තත්" අඩව්ව නර්තනය කළ හැකි තාල රූපය වන්නේ

i. මාත්‍රා 2 + 3 ය.
ii. මාත්‍රා 2 + 4 ය.
iii. මාත්‍රා 3 + 4 ය.
iv. මාත්‍රා 2 + 2 + 4 ය

40). උඩරට වෙස් ඇඳුම් කට්ටලයේ දෑතට පළඳින ආභරණ වන්නේ,

i. උරබාහු හා අවුල් හැරය
ii. බන්දි වළලු හා කෙමෙත්ත
iii. බන්දි වළලු හා බුබුළු පටිය
iv. උරබාහු හා අවුල් හැරය

## නැටුම් දේශීය - II

**පළමුවැනි ප්‍රශ්නය අනිවාර්ය වේ.**
**පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
**සෑම ප්‍රශ්නයකටම ලකුණු 12 බැගින් හිමි වේ.**

1. සියළුම ප්‍රශ්න වලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.
   i) අතීතයේ මළබෙර වාදනය සඳහා මුලින් ම යොදාගෙන ඇත්තේ ............... බෙරයයි.
   ii) ලෝක නර්තන දිනය .................වේ.
   iii) බලිශාන්ති කර්මයේ ඇදුරන් තාල තැබීම සඳහා .................. භාවිතා කරයි.
   iv) මහබඹා කෝලම .................. පෙරහැරේ විශේෂාංගයකි.
   v) ශාන්ති නිකේතනයේ නිර්මාතෘ වන්නේ .................. ය.
   vi) කෙත ආශ්‍රිත ගැමි නැටුම් වලදී .................. වාදනය කර ඇත.
   vii) ජායිපූර් ලක්නව් ප්‍රදේශවල .................. නර්තන සම්ප්‍රදාය ප්‍රචලිතය.
   viii) පාසල් අධ්‍යාපනයට සෞන්දර්ය විෂයය ඉගැන්වීම ආරම්භ වූයේ .................. වර්ෂයේය.
   ix) පහත නම් සඳහන් ප්‍රවීණ ශිල්පීන් දෙදෙනා අයත් නර්තන සම්ප්‍රදායන් නම් කරන්න.
      (අ) ඉඹුල්ගොඩ මහතා (ආ) සිරිබෝහාමි මහතා
   x) එලතාලම් හා වෙන්ගිලම් යන වාද්‍ය භාණ්ඩ වාදනය කරන ශිල්පීන් නම් කරන්න.
      (අ) ඉලතාලම් (එලතාලම්) (ආ) වෙන්ගිලම්

2) I. සුළු මහ දෙතිතට අදාළව බෙර පදයක් ප්‍රස්තාර කරන්න.
   II . "රනේ රුවසෙ වත රුවින් දිලේදෝ" යන කවිපදය අදාළ තිත් රූපයට ප්‍රස්තාර කරන්න.
   III. මුසලඩි වන්නමේ කස්තිරම ප්‍රස්තාර කරන්න.

3) පහත සඳහන් මාතෘකා අතුරෙන් තුනක් කෙටියෙන් විස්තර කරන්න.
   I. ප්‍රශස්ති කවි ii.ද්‍රවිඩ ගැමි නැටුම් iii.මණිපුරි රංගවස්ත්‍රාභරණ iv.දළඳා පෙරහැර
   iv.දළඳා පෙරහැර v. පණීභාරත මහතා

4) දේශීය ශාන්තිකර්ම තුළ එකිනෙකට ආවේණික වූ ගායන, වාදන, නර්තන අංග රංගවස්ත්‍රාභරණ දක්නට ලැබේ.
   I. කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ ආඝාතාත්මක ගායනා 02ක් හා අනාඝාතාත්මක ගායනා 02ක් නම් කරන්න.
   II. දෙවොල් මඩුව ශාන්ති කර්මයේ නාට්‍යමය පෙළපාලි 02ක් පිළිබඳ හැඳින්වීමක් කරන්න.
   III. "යහපත් සමාජයක් බිහිකිරීමෙහිලා" පහන් මඩුව ශාන්ති කර්මයේ එන කථා පුවතින් ලබාගත හැකි ආදර්ශ පිළිබඳ විවරණයක් කරන්න.

5) දේශීය නර්තනයේ විකාශනය පිළිබඳ අධ්‍යයනයේදී විවිධ වූ මූලාශ්‍ර වැදගත් වේ.
   I. ගම්පල යුගයේ ගල් කැටයම් තුළින් නර්තන ඉතිහාසය හා සම්බන්ධ පුරා විද්‍යාත්මක මූලාශ්‍ර 02ක් ලියන්න.
   II. අතීතයේ භාරතීය කාන්තා නර්තන ලාලිත්‍ය වර්ණනාවී ඇති අයුරු පරෙවි සංදේශය ඇසුරින් විමසන්න.
   III. රාජ්‍ය පාලකයින් පවා ශාන්ති කර්ම පැවැත් වූ බවට තහවුරු කෙරෙන සාධක ඓතිහාසික කෘති දෙකක් ඇසුරින් විස්තර කරන්න.

6) පහත රූප රාමු ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



A B C D

   I . "B" හා "C" වල දැක්වෙන නාටක නම් කර B රූප සටහනට අදාළ නාටකයේ කවියක් ලියන්න.
   II. "A" රූපයේ දැක්වෙන මුද්‍රානාට්‍ය නම් කර එහි භාවිත නර්තන ශෛලීන් පිළිබඳ ඇගයීමක් කරන්න.
   III. "D" රූපයේ සඳහන් නර්තන සම්ප්‍රදාය නම් කර එකී සම්ප්‍රදාය තුළ වේෂ නිරූපණය භාවිත කර ඇති ආකාරය උදාහරණ දක්වමින් විග්‍රහ කරන්න.

7) I. නර්තනය හැදෑරීමෙන් අත්පත් කරගත හැකි යහපත් ගුණාංග හතරක් නම් කරන්න.
   II. නර්තනයක සාර්ථකත්වය උදෙසා සංගීතයෙන් ලැබෙන පිටිවහල අගයන්න.
   iii. නර්තනය හැදෑරීම කායික හා මානසික වර්ධනයට බලපාන අයුරු විස්තර කරන්න.

අවසාන වාර පරීක්ෂණය - 2023
11 ශ්‍රේණිය - නැටුම් (දේශීය)
ප්‍රායෝගික පරීක්ෂණය

| අනු අංකය | ක්‍රියාකාරකම | ලකුණු |
|---|---|---|
| (01) | ක්‍රියාකාරකම ගායනය හා වාදනය<br>I) කැමැති ගායනයක්<br>ii) නම් කරන ලද ගායනයක් (ගුරු අභිමතය පරිදි)<br>iii) කැමති බෙර සරඹයක් තාල තබා කීම හා වාදනය<br>iv) කැමති බෙර පදයක් තාල තබා කීම හා වාදනය | <br>05<br>05<br>05<br>05<br>20 |
| (02) | ක්‍රියාකාරකම :- සරඹ නර්තනය හා වට්ටම් නර්තනය<br>I) 6 - 12 දක්වා ගොඩසරඹ වලින් එකක් ඊට අදාළ<br>කස්තිරම සමඟ<br>ii) වට්ටම් නර්තනය<br>මාත්‍රය හා කස්තිරම නර්තනය<br>අඩව්ව නර්තනය | <br>05<br>05<br><br>05<br>05<br>20 |
| (03) | ක්‍රියාකාරකම :- වන්නම් නර්තනය<br>සිංහරාජ/ සැවුලා/මුසලඩි වන්නම් වලින් එකක්<br>✱ මාත්‍රා දෙකක් නර්තනය<br>✱ කස්තිරම, සීරුමාරුව අඩව්ව නර්තනය | <br><br>08<br>12<br>20 |
| (04) | ක්‍රියාකාරකම :- ගැමි නැටුම් නර්තනය හා නාට්‍යගීත නර්තනය<br>I ගැමි නැටුම් :- රබන්/චාමර/කඩු/මෝල්ගස්/සවරන්<br>මාත්‍රා දෙකක් නර්තනය<br>ii නාට්‍ය ගීත අනුව නර්තනය<br>හනික වරෙව් කොල්ලනේ / දීකිරි, දීකිරි | <br><br>10<br><br>10<br>20 |
| (05) | ක්‍රියාකාරකම :- චරිත නිරූපණය<br>(ගුරු අභිමතය පරිදි චරිත ගොඩ නගන්න)<br>මොණරා , සිංහයා, ධීවරයා, මහලු කාන්තාව<br>( සිද්ධිය ගොඩ නැගීම, නර්තන භාවිතය, භාව නිරූපණය<br>ප්‍රාසාංගික බව හා අවකාශ භාවිතය) | <br><br><br>5 x 4<br>20 |
| | මුළු ලකුණු | 100 |